CENTRE FOR MONITORING ELECTION VIOLENCE
මැතිවරණ ප්‍රචණ්ඩක්‍රියා නිරීක්‍ෂණ මධ්‍යස්ථානය
தேர்தல் வன்முறைகளைக் கண்காணிப்பதற்கான நிலையம்
No 6/5, Layards Road, Colombo 05, **Tel:** +094-11 3010664
**Fax**: +094-11 2505228 **E-mail**: cmev@cpalanka.org **Web**: www.cmev.org

# පළාත් පාලන ආයතන ඡන්ද විමසීම 2018

*මැතිවරණ දින මාධ්‍ය නිවේදනය - 01*

පළාත් පාලන ආයතන මැතිවරණයේ ඡන්ද ප්‍රකාශ කිරීම උදෑසන 7 ට ආරම්භ විය. මැ.ප්‍ර.නි.ම වෙතට ලැබුන වාර්තාවලට අනුව වර්ෂ 2018 පෙබරවාරි මස 10 වන දින පෙ.ව 10.00 වන විට රටේ බොහෝ ප්‍රදේශවල ඡන්ද ප්‍රකාශ කිරීමේ කටයුතු සැලකිය යුතු මට්ටමේ අවහිරයකින් තොරව නිදහස් හා සාමකාමී අයුරින් පැවැත්වෙන බව දැනගැනීමට ලැබේ. අද දින පෙ.ව 10.00 වන විට මැතිවරණ නීති උල්ලංඝනය කිරීමේ සිදුවීම් 39 ක් වාර්තා වී ඇති අතර ඉන් බරපතල තත්වයේ සිද්ධි 04 ක් ද සාමාන්‍ය මට්ටමේ සිද්ධීන් 35 ක් ද වශයෙන් වාර්තා වී ඇත. ඡන්ද මධ්‍යස්ථාන අවට තර්ජනය කිරීමේ හා පහරදීමේ සිදුවීම් පිළිබඳ පැමිණිලි කිහිපයක් මැ.ප්‍ර.නි.ම වෙත ලැබී ඇත. පෙ.ව 8.10 ට පමණ එක්සත් ජාතික පක්ෂයේ අපේක්ෂකයෙකු සහ ඔහුගේ අධාරකරුවන් විසින් සෙසු දේශපාලන පක්ෂ ආධාරකරුවන් හට පහරදීමේ සිදුවීමක් නැගෙනහිර පළාතෙන් මැ.ප්‍ර.නි.ම වෙත වාර්තා වී ඇත. මෙම සිදුවීම අම්පාර දිස්ත්‍රික්කයේ කල්මුනෙයි මහ නගර සභා බල ප්‍රදේශයෙහි, පෙරියනිලවනෙයි කොට්ඨාසයට අයත් පුලබාමනී ශාර්ෆියුදීන් මහා විද්‍යාලයේ ස්ථාපිත කොට ඇති ඡන්ද මධ්‍යස්ථානය අසලදී සිදු වී ඇත.

නැගෙනහිර පළාතේ හිටපු මහ ඇමති නසීර් අහමඩ් මහතාගේ ආරක්ෂාව සඳහා යොදවා ඇති ආරක්ෂක නිලධාරීන් විසින් අල්පීෆ්රියා විදුහලේ ස්ථාපිත කොට ඇති ඡන්ද මධ්‍යස්ථානය අවට සිටි පුද්ගලයන් හට තර්ජනය කිරීමේ සිද්ධියක් මැ.ප්‍ර.නි.ම වෙතට වාර්තා වී ඇත.

එක්සත් ජාතික පක්ෂයේ අපේක්ෂකයෙකු වන රෙයිස් ප්‍රනාන්දු නැමැත්තා එක්සත් ජාතික නිදහස් පෙරමුණේ අපේක්ෂකයෙකු හට බැන වැදීමේ සහ මරණ තර්ජන එල්ල කිරීමේ සිදුවීමක් බස්නාහිර පළාතෙන් මැ.ප්‍ර.නි.ම වෙත වාර්තා විය. මෙම සිදුවීම මීගමුව මහ නගර සභා බල ප්‍රදේශයේදී පෙ.ව 7.05 ට පමණ සිදු වී ඇති බව සඳහන් වේ.

මහනුවර දිස්ත්‍රික්කයේ හල්ලොලුව මැතිවරණ කොට්ඨාසයේ හල්ලොලුව නවෝද්‍යා මහ විද්‍යාලය තුල ස්ථාපිත කොට ඇති ඡන්ද මධ්‍යස්ථානයේ ඡන්ද ප්‍රකාශ කිරීමට යොදා ගන්නා කුටි 04 ම ඡන්දයේ රහස්‍ය භාවය අහෝසි වන අයුරින් ස්ථානගත කොට ඇති බව මැ.ප්‍ර.නි.ම හි දිස්ත්‍රික් සම්බන්ධීකාරකවරයා විසින් පෙ.ව 7.35 ට පමණ අප වෙත වාර්තා කරනු ලැබිනි.

සෑම පළාතකින්ම මේ දක්වා ලැබී ඇති පැමිණිලි වලින් බහුතරයක් සමන්විත වන්නේ නීති විරෝධී මැතිවරණ ප්‍රචාරණය, ඡන්ද දායකයන් හට බලපෑම් සිදුකිරීම, මැතිවරණ ප්‍රචාරක පත්‍රිකා බෙදා හැරීම හා පෝස්ටර් ප්‍රදර්ශනය කිරීම වැනි සිදුවීම් වලින් වන අතර ඉහත සඳහන් කළ නීති විරෝධී ප්‍රචාරන ක්‍රමවේදයන් අතර පක්ෂ සළකුණු ඉදිරියේ කතිරය (x) සටහන් කොට ඇති ආකාරය දක්වෙන අවට ප්‍රදේශයේ බෙදා හැරීම යන උපක්‍රම විශේෂයෙන් නිරීක්ෂණය විය.

ගම්පහ දිස්ත්‍රික්කයේ තේ වත්ත ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයට අයත් හුණුපිටිය බණ්ඩාරනායක ප්‍රාථමික විද්‍යාලයේ ස්ථාපිත ඡන්ද මධ්‍යස්ථානයට මීටර් 100 ක් පමණ දුරින් එක්සත් ජාතික පක්ෂයේ ප්‍රචාරණ ස්ටිකර් අලවන ලද වාහනයක් එම පක්ෂය සඳහා කතිරය (x) ලකුණු කරන ලෙස හැගවෙන ආකාරයෙන් දක්වෙන සේ නවතා තිබූ බව මැ.ප්‍ර.නි.ම වෙත වාර්තා වී ඇත. මෙම වාහනය අංක CAM-4179 දරන ඇල්ටෝ වර්ගයේ මෝටර් රථයක් වන බව එම වාර්ථාවේ සඳහන් වේ.

ගම්පහ දිස්ත්‍රික්කයේ දොම්පේ ප්‍රදේශයේ අවට පෙ.ව 9.00 ට පමණ ශ්‍රී ලංකා පොදුජන පෙරමුණේ අපේක්ෂකයින් නීති විරෝධී ආකාරයෙන් මැතිවරණ ප්‍රචාරණ කටයුතු වල නිරත වූ බව මැ.ප්‍ර.නි.ම වෙත වාර්තා විය.

මීතොටමුල්ල නගර සභාවට එක්සත් ජාතික පක්ෂයෙන් තරඟ කරන ගුණසීල සිල්වා යන අය නීති විරෝධී ආකාරයෙන් උදෑසන කාලයෙහි මැතිවරණ ප්‍රචාරයේ යෙදෙමින් සිටි බව මැ.ප්‍ර.නි.ම වෙත වාර්තා වී ඇත.

එක්සත් ජාතික පක්ෂ යෙන් පලාගල ප්‍රාදේශීය සභාව සඳහා තරඟ වදින සුරංග රත්නායක නම් අපේක්ෂකයා අනුරාධපුර හල්මිල්ල ප්‍රදේශයේ තෙලදෙන වැවට මීටර් 10 ක් පමණ ඔබ්බෙහි සිට එක්සත් ජාතික පක්ෂයට ඡන්දය ලබා දෙන ලෙස අයදිමින් ප්‍රචාරණ පත්‍රිකා බෙදා හරිමින් සිටි බව මැ.ප්‍ර.නි.ම වෙතට වාර්තා වේ.

මොනරාගල ප්‍රාදේශීය සභාව සඳහා තරග කරන එක්සත් ජාතික පක්ෂයේ අපේක්ෂක අජිත් සහ ඔවුනගේ ආධාරකරුවන් පිරිසක් සුභාග්‍ය විද්‍යාලයේ ස්ථාපිත ඡන්ද මධ්‍යස්ථානය අසල ගැවසෙමින් ඔහුට ඡන්දය ලබා දෙන ලෙස ඡන්දදායකයින් හට බලපෑම් කරමින් සිට ඇති බව අප වෙත වාර්තා විය. ශ්‍රී ලංකා පොදුජන පෙරමුණෙන් එම ප්‍රාදේශීය සභාව සඳහාම තරග වදින ශ්‍රියාලතා නැමති අපේක්ෂිකාවගේ ස්වාමී පුරුෂයා ද විපුලානන්ද දෙමළ විද්‍යාලයේ ස්ථාපිත ඡන්ද මධ්‍යස්ථානය අසල රැඳී සිටිමින් ඡන්ද දායකයන් හට බලපෑම් සිදුකල බව මැ.ප්‍ර.නි.ම වෙත වාර්තා වී ඇත.

පොතුවිල් ප්‍රාදේශීය සභාව සඳහා එක්සත් ජාතික පක්ෂයෙන් තරග වදින කේ. සෙක්කවන්නාර් නැමති අපේක්ෂකයා සහ ඔහුගේ ආධාරකරුවන් විසින් චාරුල්ෆල්ලා විද්‍යාලයේ ස්ථාපිත ඡන්ද මධ්‍යස්ථානය අසල සිටිමින් එක්සත් ජාතික පක්ෂයට තම ඡන්දය ලබා දෙන ලෙස ඡන්ද දායකයින් හට පවසා ඇති බව මැ.ප්‍ර.නි.ම වෙත වාර්තා වී ඇත.

පොතුවිල් ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ මතුරංජනෙයි කොට්ඨාසයේ පිහිටි චාරුල්ෆල්ලා විද්‍යාලයට පිවිසෙන මාර්ගයේ අසල රැඳී සිටිමින් එක්සත් ජනතා නිදහස් සන්ධානයේ ආධාරකරුවන් පිරිසක් විසින් එම පක්ෂය සඳහා තම ඡන්දය ලබා දෙන ලෙස ඡන්ද දායකයින් හට බලපෑම් කරනු ලැබූ බව අප වෙත වාර්තා විය.

ශ්‍රී ලංකා පොදුජන පෙරමුණේ අපේක්ෂකයින් කිහිපදෙනෙක්ම ඡන්ද දායකයන් හට අනිසි බලපෑම් සිදුකිරීමේ හා බලපෑම් කිරීමේ අවස්ථා රැසක් මැ.ප්‍ර.නි.ම විසින් නිරීක්ෂණය කොට ඇති අතර එක්සත් ජාතික පක්ෂ විසින් ද ඒ පිළිබඳ පැමිණිලි කිහිපයක් මැ.ප්‍ර.නි.ම වෙත ලැබී ඇත. මෙම සිදුවීම්වලින් කිහිපයක් පහත පරිදි වේ.

ශ්‍රී ලංකා පොදුජන පෙරමුණේ අපේක්ෂක ජයවීර මාතරආරච්චි විසින් ඉගිනිගහගොඩ විද්‍යාලය, මුල්ලැදියාව මහ විදනලය හා බුරුතකන්ද ප්‍රජා ශාලාව යන ස්ථාන වල ස්ථාපිත ඡන්ද මධ්‍යස්ථාන අවට මේ ආකාරයෙන් අනිසි බලපෑම් සිදුකොට ඇති අතර ශ්‍රී ලංකා පොදුජන පෙරමුණේ අපේක්ෂක ඉදුනිල් රාජපක්ෂ විසින් දොරපනේ, කැටපනේ සහ බිමල්පේ යන ඡන්ද මධ්‍යස්ථාන අසලදී එවැනි බලපෑම් සිදුකොට ඇති බව වාර්තා වේ.

පෙ.ව 8.30 ට පමණ පුත්තලම දිස්ත්‍රික්කයේ රත්මල්යාය ප්‍රදේශයේ කසීම් නගර් විද්‍යාලය අසල, එක්සත් ජාතික පක්ෂයේ එම්.එන්.එම්.රිෆාස් නැමැත්තා ප්‍රචාරණ පත්‍රිකා බෙදා හරිමින් නිතී විරෝධී මැතිවරණ ප්‍රචාරණයේ යෙදෙන ආකාරය ශ්‍රී ලංකා මුස්ලිම් කොන්ග්‍රසයේ අපේක්ෂක ෆාතිම් විසින් නිරීක්ෂණය කරනු ලැබ ඇත. ඉන් අනතුරුව ෆාතිම් නැමති අපේක්ෂකයා හට රිෆාස් විසින් තර්ජනය කොට ඇති අතර එම අවස්ථාවේදී පොලිස් නිලධාරීන්ගේ සහය ද රිෆාස් වෙත ලැබුනු බව නිරීක්ෂණය වී තිබේ.

කුරුණෑගල දිස්ත්‍රික්කයේ පන්විල ප්‍රාදේශීය සභාව සඳහා එකසත් ජාතික පක්ෂයෙන් තරඟ වදින පියල් අශෝක රණසිංහ නැමැත්තා කාන්තාවන් 158 දෙනෙකු උදෙසා දානමය කටයුත්තක් සංවිධානය කොට ඇති අතර ඒ පිළිබඳ පැමිණිලි කිරීමෙන් අනතුරුව පොලීසිය විසින් එම දානමය කටයුත්ත නවත්වා තිබේ.

**මැතිවරණ ප්‍රචණ්ඩක්‍රියා නිරීක්ෂණ මධ්‍යස්ථානයේ මැතිවරණ නිරීක්ෂණ ක්‍රියාන්විතය**

මැ.ප්‍ර.නි.ම විසින් දිවයින පුරා ස්ථිතික නිරීක්ෂකයින් ද ඇතුළත්ව 2000 කට ආසන්න නිරීක්ෂකයින් සංඛ්‍යාවක් මැතිවරණ දිනය තුළ සිදුවන ප්‍රචණ්ඩක්‍රියා සහ මැතිවරණ ආශ්‍රිත නීති උල්ලංඝනය කිරීම් වැනි සිදුවීම් නිරීක්ෂණය කිරීමේ අරමුණින්, ඡන්ද මධ්‍යස්ථානවල හා ඒ ආශ්‍රිත ප්‍රදේශවල යොදවා ඇත.

මැ.ප්‍ර.නි.ම වර්ෂ 1997 දී විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය, නිදහස් මාධ්‍ය ව්‍යාපාරය සහ දේශපාලන ප්‍රචණ්ඩත්වයට එරෙහි සංවිධානය එක්ව ස්වාධීන හා අපක්ෂපාතී සංවිධානයක් ලෙස මැතිවරණයන්හි ප්‍රචණ්ඩක්‍රියා නිරීක්ෂණයට ස්ථාපිත කරන ලදී. වර්තමානය වන විට මැ.ප්‍ර.නි.ම විකල්ප ප්‍රතිපත්ති ක්‍රමවේදයෙන් සහ මානව හිමිකම් දත්ත කේන්ද්‍රයෙන් (INFORM) සමන්විත වේ.

මැ.ප්‍ර.නි.ම සියලු වාර්තා සහ මාධ්‍ය නිවේදන www.cmev.org වෙතින් ලබා ගත හැකිය.